වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ
Professionals' National Front
275/75 Professional Centre,
Prof. Stanley Wijesundara Mawatha, Colombo 07

Telephone : 0112580886
Fax : 0112503586
Email : pnflanka@gmail.com

23.09.2020 PNF/HE/2020/0003

අතිගරු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා
ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජය
ජනාධිපති කාර්යාලය
ගාලු මුවදොර,
කොළඹ 01.

අතිගරු ජනාධිපතිතුමනි,

**20 වැනි සංශෝධනය තුළ අඩංගු ජනතා අභිලාෂයන්ට හානිකරන කරුණු කිහිපයක් සම්බන්ධව**

19 වන ව්‍යවස්ථා සංශෝධනය මගින් රාජ්‍ය දුර්වලවීම නිසා රටට සිදුවූ අගතිය පිළිබඳව මහජනයා අතර විවාදයක් ඇත. ඒ නිසාම රටට යහපත් ආකාරයට එම සංශෝධනය නැවත සංශෝධනය විය යුතු බවටද විවාදයක් ඇත. නමුත් වැරදි නිවැරදි කිරීම සඳහා රජය විසින් ඉදිරිපත් කොට ඇති 20 වන සංශෝධනය මගින් යම් වැරදි නිවැරදි කිරීමට අමතරව අනාගතයේදී රටට අහිතකර ගැටළු ප්‍රමාණයක් නිර්මාණය වීමේ අවධානමක් ඇති බව මේ වන විට විද්වතුන් පමණක් නොව මහා සමාජය තුලද කතිකාවක් ඇතිවී ඇත.

විශේෂයෙන්ම පහත සඳහන් ප්‍රධාන කරුණු හතරක් පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කිරීමට කැමැත්තෙමු.

I. හදිසි පනත් සම්මත කිරීමේ ප්‍රතිපාදන නැවත ඇතුල් කිරීම මගින් ජනතාවගේ ප්‍රජාතන්ත්‍රවාදී අයිතිය අභියෝගයට ලක්ව තිබීම.
II. විගණකාධිපතිවරයා පත්කිරීමට සහ විගණකාධිපතිවරයා විසින් රජයට අයත් සමාගම් විගණනය කිරීමට ඇතුළුව පනවා ඇති බාධක මගින් මහජන විශ්වාසය පලුදු වීමේ අවධානම ඇති බව සහ ඒ මගින් MCC ගිවිසුම අත්සන් කිරීමට එරෙහිව පවතින ප්‍රධාන බාධකයක්ද ඉවත්වන බව.
III. මහ බැංකු වංචාවට පසුව තීරණාත්මකව වැදගත් වන රාජ්‍ය ආයතන වලට ප්‍රධානීන් පත්කිරීමේදී ද්විත්ව පුරවැසියන්ට එම තනතුරු ලබා නොදිය යුතු බවට සමාජය තුළ තහවුරු වී ඇති මතයට එරෙහිව යමින් මන්ත්‍රීවරුන්ට පනවා තිබූ එම බාධකය ඉවත්කිරීම මගින් මහජන අපේක්ෂා බිඳ වැටීම.
IV. ප්‍රසම්පාදන කොමිසම අහෝසි කිරීම මගින් වංචා දූෂණ වැළක්වීමට අදාළව ආණ්ඩුවේ ප්‍රතිරූපයට හානි සිදුකිරීම හා මහජන විශ්වාසය ඒ තුළින් නැති වීම.

ඉහත සඳහන් කරුණු සියල්ල ඔබගේ ජනවරමේ අධ්‍යාත්මයන්ට හානි සිදුකරන බැවින් සහ එම තත්ත්වය ඔබ සහ අප අපේක්ෂා කරන ගමනට හානිකර වන බැවින් එම කරුණු නිවැරදි කොට 20 වැනි සංශෝධනය සම්මත කිරීම සඳහා ක්‍රියාකරන ලෙසත් ඉදිරියේදී සිදුකෙරෙන පූර්ණ ව්‍යවස්ථා සංශෝධනය සඳහා මෙය පාදක කරගන්නා ලෙසත් ඉතා ගෞරවයෙන් ඉල්ලා සිටිමු.

මීට,
දේශයට හිතැති,

ඉංජිනේරු කපිල රේණුක පෙරේරා
ප්‍රධාන ලේකම්
වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ

වෛද්‍ය සමන්ත ආනන්ද
ජ්‍යෙෂ්ඨ උප සභාපති
වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ

වෘත්තිකයන්ගේ ජාතික පෙරමුණ නියෝජනය කරන සංවිධාන

- රජයේ වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
- තොරතුරු තාක්ෂණ වෘත්තීයවේදීන්ගේ සංසදය
- වෘත්තීය ව්‍යවසායකයන්ගේ සංගමය
- ලංකා බැංකු සේවක සංගමය
- මව්බිම ලංකා පදනම
- දූරකතන සන්නිවේදන ඉංජිනේරු සංගමය
- ශ්‍රී ලංකා නීතිඥ සංගමය
- ඵලදායී අධ්‍යාපනය සඳහා වූ ව්‍යාපාරය
- ඉංජිනේරු සංවිධානය
- දේශීය ආදායම් වෘත්තීය සමිති ඒකාබද්ධ කමිටුව
- රජයේ ආයුර්වේද වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
- රාජ්‍ය සේවා එක්සත් හෙද සංගමය
- රජයේ දන්ත වෛද්‍ය නිලධාරීන්ගේ සංගමය
- ශ්‍රී ලංකා රේගු නිලධාරීන්ගේ සංගමය
- ජාතික විශ්වවිද්‍යාල ආචාර්ය සංගමය
- දුම්රිය ශ්‍රේණිගත වෘත්තීය සමිති එකමුතුව
- ලංකා ඛනිජතෙල් නීතිගත සංස්ථා ඉංජිනේරු සංගමය
- ලංකා ප්‍රගති ගුරු සංගමය
- නිදහස් ඉදිකිරීම්කරුවන්ගේ පෙරමුණ
- ඉංජිනේරුමය කාර්යයන් පිලිබඳ මධ්‍යම උපදේශක කාර්යාංශය
- ශ්‍රී ලංකා කාර්මික අධ්‍යාපන සේවයේ විධායක නිලධාරීන්ගේ සංගමය
- ප්‍රගතශීලී බැංකු සේවක පෙරමුණ
- ජාතික සංචාරක වෘත්තිකයන්ගේ සංගමය
- ශ්‍රී ලංකා විධායක නිලධාරීන්ගේ සංගමය
- විද්වත් වෘත්තිකයන්ගේ සංගම් සංවිධානය

පිටපත්: ගරු අග්‍රාමාත්‍යතුමා
සියළු කැබිනට් අමාත්‍යවරුන්
සියළු රාජ්‍ය අමාත්‍යවරුන්
සියළු පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්
සියළු ජනමාධ්‍ය ආයතන